# 6 ශ්‍රේණිය

# විද්‍යාව - පුනරීක්ෂණ

## ඒකක පුනරීක්ෂණ සහ පිළිතුරු

## පළමු ඒකකය

## (2021- නව නිර්දේශය)



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(6 ශ්‍රේණිය විද්‍යාව 01 ඒකකයට අදාල ප්‍රශ්න පත්‍ර 04ක් සහ පිළිතුරු අන්තර්ගතය.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# ජෛව ලෝකයේ අසිරිය

**6 ශ්‍රේණිය**

Grade 6



| | | |
|---|---|---|
| **විද්‍යාව**<br>Science | **ඒකක පරීක්ෂණය - 01**<br>Unit test - 01 | **කාලය මිනිත්තු 30 යි**<br>Time 30 min. |

# ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
# වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. වයසින් වැඩිවත්ම ප්‍රමාණයෙන් විශාල වීම,
(1) ප්‍රසාරණයයි (2) වර්ධනයයි (3) සංකෝචනයයි (4) පෝෂණයයි

02. ක්ෂුද්‍රජීවියෙක් වනුයේ,
(1) මදුරුවා (2) පැරමීසියම් (3) උකුණා (4) කුඹියා

03. අපත් ඇතුළුව අපේ වටපිටාව යනු,
(1) පරිසරයයි (2) නිවසයි (3) ගෙවත්තයි (4) ගමයි

04. ජීවීන් සම්බන්ධව දී ඇති වගන්ති අතරින් අසත්‍ය වගන්තිය තෝරන්න.
(1) සෑම ජීවියෙක්ම වර්ධනය වේ (2) ශාක සංචරණය කරන අතර සතුන් චලන දක්වයි
(3) ශාක ස්වයංපෝෂී වන අතර සතුන් විෂමපෝෂීය (4) සෑම ජීවියෙක්ම ස්වසනය කරයි

05. ඔත් ජීවිතයක් ගත කරන සත්ත්වයෙකි.
(1) මුහුදුමල (2) ගොළුබෙල්ලා (3) කුඩැල්ලා (4) ඉස්සා

06. සතුන්ගෙන් ශාක වෙනස් වන ශාක සතු ලක්ෂණයක් නොවන්නේ,
(1) ශාකවල වර්ධනය සීමා රහිත වීම (2) ශාක සංචරණය නොකිරීම
(3) ශාක ස්වසනය නොකිරීම (4) ශාක ස්වයංපෝෂීවීම

07. ජලජ ශාකයක් නොවේ
(1) වැලිස්නේරියා (2) ඕලු (3) කිරල (4) සැල්විනියා

08. පෙරා බුදීමේ භෝජන ක්‍රමය මගින් පෝෂණය ලබන්නේ,
(1) මෝරා (2) මදුරුවා (3) තල්මසා (4) කොටියා

09. පඳුරු ලෙස වැඩෙන ශාකයකි.
(1) වැල්දොඩම් (2) කොස් (3) කුඩළු (4) බට

10. තම ආහාර තමා විසින්ම නිපදවා ගන්නා ජීවීන් හඳුන්වන නම කුමක් ද ?
(1) විෂමපෝෂීන් (2) වියෝජකයින් (3) ස්වයංපෝෂීන් (4) සහජීවීන්

11. විද්‍යාගාරයේ දී කාබන්ඩයොක්සයිඩ් වායුව හඳුනාගැනීම සඳහා යොදාගනු ලබන්නේ,
(1) හුණුගල් (2) හුණු දියර (3) අයඩීන් (4) කොපර්සල්ෆේට්

12. ස්වසන අවයවය සහ උදාහරණ ජීවියා සාවද්‍ය ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) පෙනහලු - ගෙම්බා (2) කරමල් - කුකුළා
(3) ස්වාසරන්ද්‍ර - කැරපොත්තා (4) තෙතසම - ගැඩවිලා

13. රූපයේ ලෙස හුණු දියර තුළට ප්‍රාශ්වාස වාතය වාර කිහිපයක් යවන ලදී. එවිට හුණු දියරවල ඇතිවූ වර්ණ විපර්යාසය නිවරදිව දක්වෙන පිළිතුර තෝරන්න.




(1) සුදු - කිරි (2) කිරි - අවර්ණ
(3) රෝස - කිරි (4) අවර්ණ - කිරි

14. • තරමක් ප්‍රමාණයෙන් විශාලයි.
• ශාක භක්ෂක වේ,
• සිරුර රෝම වලින් ආරක්ෂා වේ.

ඉහත ලක්ෂණවලින් කියවෙන සත්ත්වයා වනුයේ,

(1) බල්ලා (2) ගිරවා (3) ගවයා (4) බළලා

15. රූපයේ දැක්වෙන උපකරණය හා ඉන් ලබාගන්නා ප්‍රයෝජනය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.



(1) කප්පිය - බඩු ඉහළට එසවීම
(2) වෘද්ධිමානය - ශාකයක වර්ධනය මැනීම
(3) තරාදිය - ශාකයක ස්කන්ධය මැනීම
(4) මිනුම් පටිය - ශාකයක උස මැනීම

16. දින කිහිපයක් පිදුරු පල්කළ ජල සාම්පලයක ප්‍රමුඛව දකිය හැකි ක්ෂුද්‍රජීවී වර්ගය වනුයේ,

(1) පැරමීසියම් (2) මදුරුකීටයන් (3) ඉස්සන් (4) ඉයුග්ලිනා

17. නටන තෙක් රත්කළ කිරි සාම්පලයකට පස් ස්වල්පයක් දමා දිනක් ගතවූ විට කිරි අසාමාන්‍ය ලෙස තරක් වී ඇත. මින් ගතහැකි නිගමනය කුමක්ද ?

(1) පසේ ක්ෂුද්‍රජීවීන් ඇති බව (2) කිරිවල ක්ෂුද්‍රජීවීන් ඇති බව
(3) පස්වල විෂ ද්‍රව්‍ය ඇති බව (4) රත්කළ විට කිරි තරක්වන බව

18. මුදුන් මුලක් ඇති ශාකයක් වේ,

(1) උණ (2) තෘණ (3) මුං (4) වී

19. බොහෝ ක්ෂුද්‍රජීවීන් ආලෝකයට ,

(1) ආකර්ෂණය වේ (2) විනාශ වේ (3) විකර්ෂණය වේ (4) වර්ධනය වේ

20. මැ, සියඹල, රෝස, අඹ

↓ පත්‍රය පත්‍රිකාවලට බෙදී ඇත ↓ ....................................................................

උදා :- A. ....................................................................

ඉහත දෙබෙදුම් සුවියේ A ස්ථානයට යෙදිය යුතු ශාකය කුමක් ද ?

(1) සියඹල (2) මැ (3) අඹ (4) රෝස

(01) අප ඇතුළු ව අපේ වටාපිටාව පරිසරය ලෙස හැඳින්වේ.

**A)** සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

i) පරිසරයේ ඇති පණ ඇති දෑ ____________________ ලෙස හඳුන්වයි.

ii) පරිසරයේ ඇති පණ නැති දෑ ____________________ ලෙස හඳුන්වයි

iii) අපේ පරිසරයේ ඇති පහත සඳහන් ද්‍රව්‍ය හඳුනාගෙන ඒවා පණ ඇති දෑ(ජීවීන්) හා පණ නැති දෑ (අජීවීන්) ලෙස වර්ග කරන්න.



| පණ ඇති දෑ( ජීවීන් ) | පණ නැති ද්‍රව්‍ය ( අජීවීන් ) |
|---|---|
| ____________ ____________ | ____________ ____________ |
| ____________ ____________ | ____________ ____________ |
| ____________ ____________ | ____________ ____________ |
| ____________ ____________ | ____________ ____________ |

B. i) ජීවීන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක.ඒවා නම් ____________ හා ____________ වේ.

ii) "වර්ධනයවීම" ____________________ සතු ලක්ෂණයකි.

iii)ජීවීන් සතු වෙනත් ලක්ෂණ 4 ක් ලියන්න.

____________________ ____________________

____________________ ____________________

2) i) අප පරිසරයේ ජීවත් වන තනිව ගත්කළ පියවි ඇසට නොපෙනෙන ජීවීන් හඳුන්වන්නේ කුමන නමකින්ද? ____________________

ii) ඉහත සඳහන් කළ ජීවීන් දැකිය හැකි ස්ථාන හතරක් නම් කරන්න.

____________________ ____________________

____________________ ____________________

iii). එම ජීවීන් නිරීක්ෂණයට පාසල් විද්‍යාගාරයේදී යොදා ගන්නා උපකරණය කුමක්ද?.



_______________________________________________

iv. පිදුරු පල්කල ජලයේ දැකිය හැකි ක්ෂුද්‍ර ජීවීන් කිහිප දෙනෙකු පහත දැක්වේ. ඔවුන් හඳුනාගෙන නම් කරන්න.





_______________ _______________ _______________

3) 6 ශ්‍රේණියේ සිසුන් විසින් පසේ ක්ෂුද්‍ර ජීවීන් සිටිදැයි බැලීමට සිදුකරන ලද ක්‍රියාකාරකමේ නම් කළ රූපසටහනක් පහත දැක්වේ.




බීකරයට එකතුවූ ජලය අන්වීක්ෂයකින් පරීක්ෂා කරන ලදී.

i) බීකරයට එකතුවූ ජලය අන්වීක්ෂයකින් පරීක්ෂා කරන්නේ ඇයි? _______________

ii )ක්ෂුද්‍ර ජීවීන් යනු කවරෙක්ද? _______________

_______________________________________________

iii)පියවි ඇසට පෙනෙන ජීවීන් හැඳින්විය හැක්කේ කෙසේද? _______________

iv)ඔබ දන්නා එවැනි ජීවීන් දෙදෙනෙකු නම් කරන්න. _______________ _______________

v)ජීවීන් බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ තුන නම් කරන්න.__________ __________ __________

4) පහත සඳහන් වාක්‍ය නිවැරදිනම් (√) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. ඇමීබා ක්ෂුද්‍ර ජීවියෙකි. (________)

ii.ඩෙංගු , කොරෝනා,යන රෝග වෛරස් යන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය මගින් ඇතිවේ. (________)

iii. ආහාර නරක්වීම, ක්ෂුද්‍ර ජීවීන්ගේ අහිතකර බලපෑමක් නොවේ. (________)

iv. යෝගට් නිෂ්පාදනයට ක්ෂුද්‍ර ජීවීන් වැදගත්වේ. (________)

v. ක්ෂුද්‍ර ජීවීන් තනිව ගත් විට පියවි ඇසට පෙනේ. (________)

5)වරහන් තුළ දීඇති වචන අතරින් හිස්තැනට වඩාත් ගැළපෙන වචනය යටින් වචන ඉරක් අඳින්න.

i. සියළුම ජීවීන්ට ජීවත්වීම සඳහා ආහාර අවශ්‍ය වේ. ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය _______________ ( පෝෂණය / ශ්වසනය ) ලෙස හැඳින්වේ.

ii. හරිත ශාක තම ආහාර තමා විසින් ම නිෂ්පාදනය කරගැනීම නිසා ශාක__________ ( විෂමපෝෂීන් / ස්වයංපෝෂීන්) ලෙස ද හඳුන්වයි.

iii. හරිත ශාක ආහාර නිපදවීමේ ක්‍රියාවලිය සඳහා වායුගෝලයෙන්__________________ (කාබන්ඩයොක්සයිඩ් /ඔක්සිජන් ) වායුව ද පසෙන් ________________ (වාතය /ජලය ) ද අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරයි.

v. හරිත ශාක ආහාර නිපදවීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ශක්තිය________________(විදුලියෙන් / සූර්යාලෝකයෙන්) ලබාගනී.

vi. ශාක නිපදවන ආහාර මත සෘජුව ම හෝ වක්‍ර ව හෝ යැපෙන සතුන් ______________(විෂමපෝෂීන්/ ස්වයංපෝෂීන්) ලෙස හඳුන්වයි.

vii________________(ගවයා /කොටියා ) ශාක මත සෘජුවම යැපේ.

viii. __________________________(සමනලයා / කවුඩා )ශාක මත වක්‍රව යැපෙන සතෙකි.

6)




i. ඉහත නිරූපණය කෙරෙන ශාක වල සිදුවන ක්‍රියාවලිය නම් කරන්න__________________________

ii. එම ක්‍රියාවලියට අදාළ A ,B,C,D නම් කරන්න.

A ______________________________ B ______________________________

C ______________________________ D ______________________________

iii. ප්‍රභාසංශ්ලේෂණය සඳහා ශාක අමු ද්‍රව්‍ය ලෙස භාවිතයට ගන්නා ද්‍රව්‍ය වලට අදාළ අක්ෂර රූපයෙන් තෝරා ලියන්න. ____________________________________________

iv.ආහාර නිපදවීමේදී ශාක වලින් නිපදවෙන පරිසර හිතකාමී වායුව නම් කරන්න ______________

v. ශාක ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේදී ශක්තිය ලබාගන්නා ප්‍රභවය සඳහන් කරන්න______________

7. A) X හා Y ගලපන්න.

| X | Y |
|---|---|
| i.ශ්වසනයට අවශ්‍ය වේ. | කාබන්ඩයොක්සයිඩ් |
| ii. සිරුර තුළ ශක්තිය නිපදවා ගැනීමේ ක්‍රියාවලි. | පෙනහලු |
| iii. ශ්වසනයට අවශ්‍ය ඔක්සිජන් වායුව ලබා ගැනීම. | ඔක්සිජන් |
| iv.ශ්වසනයේ දී නිපදවේ. | ශ්වසනය |
| v.මිනිසාගේ ශ්වසන අවයවය | ආශ්වාසය |

8) පිළිතුරු සපයන්න.




i) මෙම ක්‍රියාකාරකම සිදුකරන්නේ ප්‍රශ්වාස වාතයේ කුමන වායුවක් අඩංගු බව පෙන්වීමටද? ______________________

ii) "X" ලෙස හඳුන්වා ඇති ද්‍රාවණය නම් කරන්න. ______________________

iii) "X" වල වර්ණය සඳහන් කරන්න. ______________________

iv) මෙහිදී කළ හැකි වූ නිරීක්ෂණ මොනවාද? ______________________

v). මෙයින් කළහැකි නිගමනය කුමක්ද? ______________________

______________________________________________

vi). ශ්වසන චලන ලෙස යටි තල්ලේ චලනයක් දැකිය හැක්කේ මෙම ජීවීන්ගෙන් කුමන ජීවියාගේද? ______________________



9) A- A හා B ගලපන්න.

| A | B |
|---|---|
| 1. ජීවීන් ප්‍රමාණයෙන් විශාල වීම | ප්‍රජනනය . |
| 2. හැන්දෑ වන විට සියඹලා ශාකවල පත්‍ර හැකිළීම. | ශ්වසනය . |
| 3 . ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය | චලනය. |
| 4. සිරුර තුළ ශක්තිය නිපදවා ගැනීමේ ක්‍රියාවලිය | වර්ධනය. |
| 5. තම වර්ගයා බෝ කිරීමේ ක්‍රියාවලිය | පෝෂණය. |

10) 1- ශාක හා සතුන් අතර ඇති වෙනස්කම් දෙකක් වගුගත කරන්න.

| ශාක | සතුන් |
|---|---|
| | |
| | |

2 දී ඇති සතුන් දෙබෙදුම් සුවියක් මගින් වර්ග කරන්න.

සතුන්



දී ඇති වචන භාවිතා කර පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

පරිසරය යනු, ...................... හා අපේ ...................... යි. අපේ පරිසරයට අයත් කොටස් කිහිපයක් වනුයේ ගොඩබිම , ................. , ......................, ......................... හා සතුන්ය. ඔබගේ ශරීර ප්‍රමාණයෙන් විශාල වීම ...................... ලෙස හඳුන්වයි. ඒ අනුව පණ ඇති සියල්ල ...................... ලෙස හඳුන්වයි. ......................... අජීවීන් වේ.

( නිවාස, ශාක, අප, වටපිටාව, ජලාශ, ජීවීන්, වර්ධනය, පණ නැති දෑ)

හිස්තැන් පුරවන්න.

(චලන දැක්වීම, සංචරණය, විෂම පෝෂීන් , ස්වයංපෝෂීන්,
වර්ධනය සීමාවක් නැත, වර්ධනය නවතී, හරිතප්‍රද වර්ණ ඇත, හරිතප්‍රද වර්ණ නැත )




(ස්වාභාවය අනුව, භෞමික, ජලජ, කඩොලාන, රූපීය ලක්ෂණ අනුව)



\# ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. තම ගෙවත්ත නිරීක්ෂණය කළ 6 ශ්‍රේණියේ ශිෂ්‍යයෙකුට හමු වූ දෑ කිහිපයක් පහත දක්වේ.
(ගඩොල් කැටය, මල්ගස, සමනළයා, ජලය )

i. දී ඇති දෑ ජීවීන් හා අජීවී ද්‍රව්‍ය ලෙස වර්ග දෙකකට බෙදන්න. (ලකුණු - 02)

ii. ඉහත බෙදීමේ දී ජීවීන් හඳුනාගැනීම සඳහා යොදාගත් ජීව ලක්ෂණය කුමක් ද ? (ලකුණු - 02)

iii. දී ඇති ජීවීන් අයත් ජීව කාණ්ඩ වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු - 02)



iv. ඉහත ජීව කාණ්ඩ වලට අයත් තවත් උදාහර්ණයක් බැගින් ලියන්න. (ලකුණු - 02)

v. රූපයේ දක්වෙන ජීවියා සහ ජීවියා අයත්වන ජීව කාණ්ඩය කුමක් ද ? (ලකුණු - 02)

vi. ජීවීන් තුළ පවතින තවත් ජීව ලක්ෂණ 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

02. අපත් ඇතුළුව අපගේ වටපිටාව පරිසරයයි.විවිධ පරිසර කොටස් ඇති අතර එක් එක් පරිසරයේ විවිධ ජීවී හා අජීවී දෑ පවතී.

i. ජීවීන් සතු පහත පද හඳුන්වන්න.

a. පෝෂණය b. ස්වසනය (ලකුණු - 04)

ii. ශාක හා සතුන් අතර ඇති ප්‍රධාන වෙනස්කම් 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

iii. ප්‍රභාසංස්ලේෂණය වායුගෝලයේ සමතුලිතතතාවයට දායකවන ආකාරයක් ලියන්න. (ලකුණු - 01)

iv. ප්‍රභාසංස්ලේෂණය සඳහා වැදගත්වන අමුද්‍රව්‍ය යුගල සඳහන් කරන්න. (ලකුණු - 02)

v. ප්‍රභාසංස්ලේෂණය සඳහා වැදගත්වන ,

a. ශක්ති ප්‍රභවය b. ශක්ති ප්‍රභේදය කුමක් ද ? (ලකුණු - 02)

vi. ජීවී විශේෂයක අඛණ්ඩ පැවැත්ම කෙරෙහි වැදගත්වන ජීව ලක්ෂණය කුමක් ද ? (ලකුණු - 01)

03. ශාක හා සතුන්ගේ පවතින විවිධත්වය පරිසර සුන්දරත්වයට හා පරිසර සමතුලතතාවයට වැදගත් වේ.

i. ජෛව විවිධත්වය යන පදය හඳුන්වන්න. (ලකුණු - 01)

ii. පහත ශාක ජීවත්වන පරිසර වෙන වෙනම ලියන්න.

a. සැල්වීනියා b. කඩොල් c. වැටකෙයියා d. කොස් (ලකුණු - 04)

iii.



a.



b.

iv. ඉහත පත්‍ර ආකාර 2 ක හඳුන්වන්න. (ලකුණු - 02)

v. ඉහත පත්‍ර ආකාර දැකිය හැකි උදාහර්ණ ශාකයක් බැගින් ලියන්න. (ලකුණු - 02)

vi. ඉහළට වැඩීම සඳහා ආධාරකයක අවශ්‍යතාවය ඇති ශාක කාණ්ඩය හඳුන්වන නම හා උදාහර්ණ ශාකයක් ලියන්න. (ලකුණු - 01)

vi. පරිසරයේ දී හමුවන ශාක දෙකක් පහත දක්වේ.එම ශාක අතර ඇති වෙනස්කම් 2 ක් ඉදිරිපත් කරන්න.

a. මිරිස් b. උක් (ලකුණු - 02)

04. සත්ත්ව විවිධත්වය පෙන්වන ආකාර දක්වෙන සටහනක් රූපයේ දක්වේ.




i. ඉහත සටහනේ a සහ b ස්ථාන වලට ඇතුලත් කළයුතු ආකාර ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

ii. භෝජන විලාසය අනුව සතුන් කාණ්ඩ දක්වා උදාහරණයක් බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු - 03)

iii. පහත දක්වෙන පරිසරවල ජීවත්වන සත්ත්වයෙක් බැගින් ලියන්න.

a. ජලජ      b. පාංශු (ලකුණු - 02)

iv. ගිරවා සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරන්න.

a. ජීවත්වන පරිසරය

b. වර්ණය

c. ප්‍රමාණය

d. සංචරණ ක්‍රමය

e. භෝජන විලාසය (ලකුණු - 05)

v. ජෛව ලෝකයේ අසිරිය සුරැකීමට ජෛව විවිධත්වය ආරක්‍ෂා කළ යුතුය. ඒ සඳහා අනුගමනය කළයුතු පියවර 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

05. ක්ෂේත්‍ර චාරිකාවක දී හමු වූ ශාක කිහිපයක් පහත දක්වේ.

( පොල්, අඹ, මීවන, මෑ )

i. පහත ලක්ෂණ දරණ ශාකයක් බැගින් තෝරා ලියන්න.

a. මුදුන්මුලක් ඇත

b. තන්තු මුල් ඇත

c. මල් නොපිපේ.

d. කඳ අතුවලට බෙදේ.

e. වැල් ගණයට අයත් වේ.

f. වෘක්‍ෂලෙස වැඩේ. (ලකුණු - 05)

ii. ජීවී වර්ගීකරණය මගින් ලැබෙන ප්‍රයෝජන 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

iii. ඉහත සඳහන් ශාක දෙබෙදුම් සුවියක් මගින් වර්ග කරන්න. (ලකුණු - 05)

සත්ව විවිධත්වය

- භෝජන ක්‍රමය අනුව
  ..................................
- සංචරණ ක්‍රමය අනුව
  ..................................
- ..........................
  ශාක භක්ෂක
  මාංශ භක්ෂක
  සර්ව භක්ෂක
- ..........................
  වර්ණය, හැඩය, උපාංග
- ජීවත් වන පරිසරය අනුව
  ..................................

(විකා ගිලින, නොකා ගිලින, යුෂ උරා බොන, ඇවිදීම, පිහිනීම, පියාසර කිරීම, බාහිර ලක්ෂණ අනුව, භෝජන විලාශය අනුව, ජලජ, වායුව,භෞමික)



පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# ජෛව ලෝකයේ අසිරිය

**6 ශ්‍රේණිය**

Grade 6



| විද්‍යාව | ඒකක පරීක්ෂණය - 01 | කාලය මිනිත්තු 30 යි |
|---|---|---|
| Science | Unit test - 01 | Time 30 min. |

# ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
# වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**Answer**

01. වයසින් වැඩිවත්ම ප්‍රමාණයෙන් විශාල වීම,
(1) ප්‍රසාරණයයි (2) වර්ධනයයි (3) සංකෝචනයයි (4) පෝෂණයයි

02. ක්ෂුද්‍රජීවියෙක් වනුයේ,
(1) මදුරුවා (2) පැරමීසියම් (3) උකුණා (4) කූඹියා

03. අප ද ඇතුළුව අපේ වටපිටාව යනු,
(1) පරිසරයයි (2) නිවසයි (3) ගෙවත්තයි (4) ගමයි

04. ජීවීන් සම්බන්ධව දී ඇති වගන්ති අතරින් අසත්‍ය වගන්තිය තෝරන්න.
(1) සෑම ජීවියෙක්ම වර්ධනය වේ
(2) ශාක සංචරණය කරන අතර සතුන් චලන දක්වයි
(3) ශාක ස්වයංපෝෂී වන අතර සතුන් විෂමපෝෂීය
(4) සෑම ජීවියෙක්ම ස්වසනය කරයි

05. [illegible] ජීවිතයක් ගත කරන සත්ත්වයෙකි.
(1) මුහුදුමල (2) ගොළුබෙල්ලා (3) කූඩැල්ලා (4) ඉස්සා

06. සතුන්ගෙන් ශාක වෙනස් වන ශාක සතු ලක්ෂණයක් නොවන්නේ,
(1) ශාකවල වර්ධනය සීමා රහිත වීම
(2) ශාක සංචරණය නොකිරීම
(3) ශාක ස්වසනය නොකිරීම
(4) ශාක ස්වයංපෝෂීවීම

07. ජලජ ශාකයක් නොවේ
(1) වැලිස්නේරියා (2) ඕලු (3) කිරල (4) සැල්විනියා

08. පෙරා බුදීමේ භෝජන ක්‍රමය මගින් පෝෂණය ලබන්නේ,
(1) මෝරා (2) මදුරුවා (3) තල්මසා (4) කොටියා

09. පඳුරු ලෙස වැඩෙන ශාකයකි.
(1) වැල්දොඩම් (2) කොස් (3) කුඹුක් (4) බට

10. තම ආහාර තමා විසින්ම නිපදවා ගන්නා ජීවීන් හඳුන්වන නම කුමක් ද ?
(1) විෂමපෝෂීන් (2) වියෝජකයින් (3) ස්වයංපෝෂීන් (4) සහජීවීන්

11. විද්‍යාගාරයේ දී කාබන්ඩයොක්සයිඩ් වායුව හඳුනාගැනීම සඳහා යොදාගනු ලබන්නේ,
(1) හුණුගල් (2) හුණු දියර (3) අයඩින් (4) කොපර්සල්ෆේට්

12. ස්වසන අවයවය සහ උදාහරණ ජීවියා සාවද්‍ය ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) පෙනහලු - ගෙම්බා
(2) කරමල් - කුකුළා
(3) ස්වාසරන්ද්‍ර - කැරපොත්තා
(4) තෙතසම - ගැඩවිලා

13. රූපයේ ලෙස හුණු දියර තුළට ප්‍රාශ්වාස වාතය වාර කිහිපයක් යවන ලදී. එවිට හුණු දියරවල ඇතිවූ වර්ණ විපර්යාසය නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.




(1) සුදු - කිරි (2) කිරි - අවර්ණ
(3) රෝස - කිරි (4) අවර්ණ - කිරි

14. • තරමක් ප්‍රමාණයෙන් විශාලයි.
• ශාක භක්ෂක වේ,
• සිරුර රෝම වලින් ආවරණය වේ.

ඉහත ලක්ෂණවලින් කියවෙන සත්ත්වයා වනුයේ,
(1) බල්ලා (2) ගිරවා (3) ගවයා (4) බළලා

15. රූපයේ දැක්වෙන උපකරණය හා ඉන් ලබාගන්නා ප්‍රයෝජනය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.



(1) කප්පිය - බඩු ඉහළට එසවීම
(2) වෘද්ධිමානය - ශාකයක වර්ධනය මැනීම
(3) තරාදිය - ශාකයක ස්කන්ධය මැනීම
(4) මිනුම් පටිය - ශාකයක උස මැනීම

16. දින කිහිපයක් පිදුරු පල්කළ ජල සාම්පලයක ප්‍රමුඛව දකිය හැකි ක්ෂුද්‍රජීවී වර්ගය වනුයේ,
(1) පැරමීසියම් (2) මදුරුකීටයන් (3) ඉස්සන් (4) ඉයුග්ලිනා

17. නටන තෙක් රත්කළ කිරි සාම්පලයකට පස් ස්වල්පයක් දමා දිනක් ගතවූ විට කිරි අසාමාන්‍ය ලෙස නරක් වී ඇත. මින් ගතහැකි නිගමනය කුමක්ද ?
(1) පසේ ක්ෂුද්‍රජීවීන් ඇති බව (2) කිරිවල ක්ෂුද්‍රජීවීන් ඇති බව
(3) පස්වල විෂ ද්‍රව්‍ය ඇති බව (4) රත්කළ විට කිරි නරක්වන බව

18. මුදුන් මුලක් ඇති ශාකයක් වේ,
(1) උණ (2) තෘණ (3) මුං (4) වී

19. බොහෝ ක්ෂුද්‍රජීවීන් ආලෝකයට ,
(1) ආකර්ෂණය වේ (2) විනාශ වේ (3) විකර්ෂණය වේ (4) වර්ධනය වේ

20. මෑ, සියඹල, රෝස, අඹ

පත්‍රය පත්‍රිකාවලට බෙදී ඇත

උදා :- A. ..........................................................

ඉහත දෙබෙදුම් සුචියේ A ස්ථානයට යෙදිය යුතු ශාකය කුමක් ද ?
(1) සියඹල (2) මෑ (3) අඹ (4) රෝස

20/20

(01) අප ඇතුළු ව අපේ වටාපිටාව පරිසරය ලෙස හැඳින්වේ.

A) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

2

i) පරිසරයේ ඇති පණ ඇති දෑ ජීවීන් ලෙස හඳුන්වයි.

ii) පරිසරයේ ඇති පණ නැති දෑ අජීවීන් ලෙස හඳුන්වයි

iii) අපේ පරිසරයේ ඇති පහත සඳහන් ද්‍රව්‍ය හඳුනාගෙන ඒවා පණ ඇති දෑ(ජීවීන්) හා පණ නැති දෑ (අජීවීන්) ලෙස වර්ග කරන්න.



10

| පණ ඇති දෑ( ජීවීන් ) | |
|---|---|
| කැපුටා | නයා |
| ගෙම්බා | ගොළුබෙල්ලා |
| මිනිසා | පොල් ගස්. |
| පක්ෂීන් | ශාක |
| | 5 |

| පණ නැති ද්‍රව්‍ය ( අජීවීන් ) | |
|---|---|
| ගල් | ජලය |
| ඔරුව | නිවාසය |
| කඳු | පස් |
| වලාකුළු | සූර්යයා |
| | 5 |

B. i) ජීවීන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක. ඒවා නම් ශාක හා සතුන් වේ.

2

ii) "වර්ධනයවීම" ජීවීන් සතු ලක්ෂණයකි.

1

iii) ජීවීන් සතු වෙනත් ලක්ෂණ 4 ක් ලියන්න.

4 පෝෂණය චලනය

ශ්වසනය ප්‍රජනනය.

2) i) අප පරිසරයේ ජීවත් වන තනිව ගත්කළ පියවි ඇසට නොපෙනෙන ජීවීන් හඳුන්වන්නේ කුමන

1 නමකින්ද? ක්ෂුද්‍ර ජීවීන්.

ii) ඉහත සඳහන් ක්ෂුද්‍ර ජීවීන් දැකිය හැකි ස්ථාන හතරක් නම් කරන්න.

පොකුණු ජලය. සම මතුපිට

4 නියඳු/ කිරිකැටු නරක් වූ ආහාර මල.

iii). එම ජීවීන් නිරීක්ෂණයට පාසල් විද්‍යාගාරයේදී යොදා ගන්නා උපකරණය කුමක්ද?

සංයුක්ත / ආලෝක අන්වීක්ෂය.



iv. පිදුරු පල්කල ජලයේ දැකිය හැකි ක්ෂුද්‍ර ජීවීන් කිහිප දෙනෙකු පහත දැක්වේ. ඔවුන් හඳුනාගෙන නම් කරන්න.



ක්ලැමිඩොමොනාස් ඇමීබා පැරමීසියම්.

3) 6 ශ්‍රේණියේ සිසුන් විසින් පසේ ක්ෂුද්‍ර ජීවීන් සිටිදැයි බැලීමට සිදුකරන ලද ක්‍රියාකාරකමේ නම් කළ රූපසටහනක් පහත දැක්වේ.




බීකරයට එකතුවූ ජලය අන්වීක්ෂයකින් පරීක්ෂා කරන ලදී.

i) බීකරයට එකතුවූ ජලය අන්වීක්ෂයකින් පරීක්ෂා කරන්නේ ඇයි? ක්ෂුද්‍ර ජීවීන් හඳුනා ගැනීමට.

ii ) ක්ෂුද්‍ර ජීවීන් යනු කවරෙක්ද? තනි තනිව ගත් කළ පියවි ඇසට නොපෙනෙන අන්වීක්ෂීය ජීවීන්.

iii) පියවි ඇසට පෙනෙන ජීවීන් හැඳින්විය හැක්කේ කෙසේද? මහා ජීවීන්.

iv) ඔබ දන්නා එවැනි ජීවීන් දෙදෙනෙකු නම් කරන්න. ගස්. බල්ලා.

v) ජීවීන් බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ තුන නම් කරන්න. ශාක සතුන් ක්ෂුද්‍රජීවීන්.

4) පහත සඳහන් වාක්‍ය නිවැරදිනම් (√) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. ඇමීබා ක්ෂුද්‍ර ජීවියෙකි. ( ✓ )

ii. ඩෙංගු , කොරෝනා,යන රෝග වෛරස් යන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය මගින් ඇතිවේ. ( ✓ )

iii. ආහාර නරක්වීම, ක්ෂුද්‍ර ජීවීන්ගේ අහිතකර බලපෑමක් නොවේ. ( ✗ )

iv. යෝගට් නිෂ්පාදනයට ක්ෂුද්‍ර ජීවීන් වැදගත්වේ. ( ✓ )

v. ක්ෂුද්‍ර ජීවීන් තනිව ගත් විට පියවි ඇසට පෙනේ. ( ✗ )

5) වරහන් තුළ දී ඇති වචන අතරින් හිස්තැනට වඩාත් ගැලපෙන වචනය යටින් වචන ඉරක් අඳින්න.

i. සියළුම ජීවීන්ට ජීවත්වීම සඳහා ආහාර අවශ්‍ය වේ. ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය ______________ ( පෝෂණය / ශ්වසනය ) ලෙස හැඳින්වේ.

ii. හරිත ශාක තම ආහාර තමා විසින් ම නිෂ්පාදනය කරගනීම නිසා ශාක __________ (විෂමපෝෂීන් / ස්වයංපෝෂීන්) ලෙස ද හඳුන්වයි.

iii. හරිත ශාක ආහාර නිපදවීමේ ක්‍රියාවලිය සඳහා වායුගෝලයෙන් __________ (කාබන්ඩයොක්සයිඩ් /ඔක්සිජන් ) වායුව ද පසෙන් __________ (වාතය /ජලය ) ද අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරයි.

v. හරිත ශාක ආහාර නිපදවීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ශක්තිය __________ (විදුලියෙන් / සූර්යාලෝකයෙන්) ලබාගනී.

vi. ශාක නිපදවන ආහාර මත සෘජුව ම හෝ වක්‍ර ව හෝ යැපෙන සතුන් __________ (විෂමපෝෂීන්/ ස්වයංපෝෂීන්) ලෙස හඳුන්වයි.

vii. __________ (ගවයා /කොටියා ) ශාක මත සෘජුවම යැපේ.

viii. __________ (සමනලයා / කවුඩා )ශාක මත වක්‍රව යැපෙන සතෙකි.

6)




i. ඉහත නිරූපණය කෙරෙන ශාක වල සිදුවන ක්‍රියාවලිය නම් කරන්න. ප්‍රභාසංශ්ලේෂණය

ii. එම ක්‍රියාවලියට අදාළ A ,B,C,D නම් කරන්න.

A සූර්ය ශක්තිය __________ B කාබන් ඩයොක්සයිඩ් වායුව ($CO_2$)

C ජලය ($H_2O$) __________ D ඔක්සිජන් ($O_2$)

iii. ප්‍රභාසංශ්ලේෂණය සඳහා ශාක අමු ද්‍රව්‍ය ලෙස භාවිතයට ගන්නා ද්‍රව්‍ය වලට අදාළ අක්ෂර රූපයෙන් තෝරා ලියන්න. C, B

iv. ආහාර නිපදවීමේදී ශාක වලින් නිපදවෙන පරිසර හිතකාමී වායුව නම් කරන්න. ඔක්සිජන් ($O_2$)

v. ශාක ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේදී ශක්තිය ලබාගන්නා ප්‍රභවය සඳහන් කරන්න. සූර්යයා.

7. A) X හා Y ගලපන්න.

| X | Y |
| --- | --- |
| i. ශ්වසනයට අවශ්‍ය වේ. | කාබන්ඩයොක්සයිඩ් |
| ii. සිරුර තුළ ශක්තිය නිපදවා ගැනීමේ ක්‍රියාවලි | පෙනහලු |
| iii. ශ්වසනයට අවශ්‍ය ඔක්සිජන් වායුව ලබා ගැනීම | ඔක්සිජන් |
| iv. ශ්වසනයේ දී නිපදවේ. | ශ්වසනය |
| v. මිනිසාගේ ශ්වසන අවයවය | ආශ්වාසය |

8) පිළිතුරු සපයන්න.




i) මෙම ක්‍රියාකාරකම සිදුකරන්නේ ප්‍රශ්වාස වාතයේ කුමන වායුවක් අඩංගු බව පෙන්වීමටද? කාබන් ඩයොක්සයිඩ් $CO_2$

ii) "X" ලෙස දැක්වා ඇති ද්‍රාවණය නම් කරන්න. හුණුදියර $Ca(OH)_2$

iii) "X" වල වර්ණය සඳහන් කරන්න. අවර්ණයයි.

iv) මෙහිදී දැකිය හැකි වූ නිරීක්ෂණය මොනවාද? හුණුදියර කිරිපැහැයට හැරේ.

v). මෙයින් කළහැකි නිගමනය කුමක්ද? ප්‍රශ්වාස වාතයේ කාබන්ඩයොක්සයිඩ් වායුව තිබේ.

vi) ශ්වසන චලන ලෙස යටි හක්කේ චලනයක් දැකිය හැක්කේ මෙම ජීවීන්ගෙන් කුමන ජීවියාගේද? ගෙම්බා.





9) A- A හා B ගලපන්න.

| A | B |
|---|---|
| 1. ජීවීන් ප්‍රමාණයෙන් විශාල වීම | ප්‍රජනනය . |
| 2. හන්දෑ වන විට සියඹලා ශාකවල පත්‍ර හැකිළීම | ශ්වසනය . |
| 3. ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය | චලනය. |
| 4. සිරුර තුළ ශක්තිය නිපදවා ගැනීමේ ක්‍රියාවලිය | වර්ධනය. |
| 5. තම වර්ගයා බෝ කිරීමේ ක්‍රියාවලිය | පෝෂණය. |

10) 1- ශාක හා සතුන් අතර ඇති වෙනස්කම් දෙකක් වගුගත කරන්න.

| ශාක | සතුන් |
|---|---|
| හරිත ලව තිබේ. | හරිත ලව නැත. |
| ස්වයංපෝෂී වේ. | විෂමපෝෂී වේ. |

2 දී ඇති සතුන් දෙබෙදුම් සුවියක් මගින් වර්ග කරන්න.




Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

දී ඇති වචන භාවිතා කර පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

පරිසරය යනු, ....අප.... හා අපේ ....වටපිටාව.... යි. අපේ පරිසරයට අයත් කොටස් කිහිපයක් වනුයේ ගොඩබිම , ....ජලාශ.... , ....නිවාස.... , ....ශාක.... හා සතුන්ය. ඔබගේ ශරීර ප්‍රමාණයෙන් විශාල වීම ....වර්ධනය.... ලෙස හඳුන්වයි. ඒ අනුව පණ ඇති සියල්ල ....ජීවීන්.... ලෙස හඳුන්වයි. ....පණ නැති දෑ.... අජීවීන් වේ.

( නිවාස, ශාක, අප, වටපිටාව, ජලාශ, ජීවීන්, වර්ධනය, පණ නැති දෑ)

හිස්තැන් පුරවන්න.

(චලන දැක්වීම, සංවරණය, විෂම පෝෂීන් , ස්වයංපෝෂීන්,
වර්ධනය සීමාවක් නැත, වර්ධනය නවතී, හරිත්‍රපද වර්ණ ඇත, හරිත්‍රපද වර්ණ නැත )

- පරිසරය
  - ....ජීවී....
    - ශාක
      - ශාකවලට පොදු ලක්ෂණ
        1. චලන දැක්වීම
        2. ස්වයංපෝෂීන්
        3. වර්ධනය සීමාවක් නැත.
        4. හරිත්‍රපද වර්ණ ඇත
    - ....සතුන්....
      - සතුන්ට පොදු ලක්ෂණ
        1. සංවරණය
        2. විෂම පෝෂීන්
        3. වර්ධනය නවතී.
        4. හරිත්‍රපද වර්ණ නැත.
  - අජීවී

(ස්වාභාවය අනුව, භෞමික, ජලජ, කඩොලාන, රූපීය ලක්ෂණ අනුව)

- ශාක විවිධත්වය
  - පරිසරය අනුව: ජලජ, කඩොලාන
  - ....රූපීය ලක්ෂණ අනුව....: මුල්, කද, පත්‍ර,එල, මල්,බීජ
  - ....ස්වාභාවය අනුව....: පැළෑටි, පඳුරු, ගස්, වැල්

# ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. තම ගෙවත්ත නිරීක්ෂණය කළ 6 ශ්‍රේණියේ ශිෂ්‍යයෙකුට හමු වූ දෑ කිහිපයක් පහත දක්වේ.
(ගඩොල් කැටය, මල්ගස, සමනලයා, ජලය )

i. දී ඇති දෑ ජීවීන් හා අජීවී ද්‍රව්‍ය ලෙස වර්ග දෙකකට බෙදන්න. (ලකුණු - 02)
ii. ඉහත බෙදීමේ දී ජීවීන් හඳුනාගැනීම සඳහා යොදාගත් ජීව ලක්ෂණය කුමක් ද ? (ලකුණු - 02)
iii. දී ඇති ජීවීන් අයත් ජීව කාණ්ඩ වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු - 02)
iv. ඉහත ජීව කාණ්ඩ වලට අයත් තවත් උදාහර්ණයක් බැගින් ලියන්න. (ලකුණු - 02)
v. රූපයේ දක්වෙන ජීවියා සහ ජීවියා අයත්වන ජීව කාණ්ඩය කුමක් ද ? (ලකුණු - 02)
vi. ජීවීන් තුළ පවතින තවත් ජීව ලක්ෂණ 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)



01. i) ජීවී - මල්ගස, සමනලයා
2 අජීවී - ජලය, ගඩොල් කැටය.
2 ii) වර්ධනය, චලනය ...
iii) මල්ගස - ශාක
2 සමනලයා - සතුන්
(12)
iv) ශාක - කොහොඹගස
2 සතුන් - බල්ලා
2 v) ඇමීබා, ක්ෂුද්‍ර ජීවීන්.
2 vi) ශ්වසනය, බෝවීමය, චලනය

02. අපත් ඇතුළුව අපගේ වටපිටාව පරිසරයයි.විවිධ පරිසර කොටස් ඇති අතර එක් එක් පරිසරයේ විවිධ ජීවී හා අජීවී දෑ පවතී.

i. ජීවීන් සතු පහත පද හඳුන්වන්න.
   a. පෝෂණය  b. ස්වසනය (ලකුණු - 04)
ii. ශාක හා සතුන් අතර ඇති ප්‍රධාන වෙනස්කම් 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)
iii. ප්‍රභාසංස්ලේෂණය වායුගෝලයේ සමතුලිතතාවයට දායකවන ආකාරයක් ලියන්න. (ලකුණු - 01)
iv. ප්‍රභාසංස්ලේෂණය සඳහා වැදගත්වන අමුද්‍රව්‍ය යුගල සඳහන් කරන්න. (ලකුණු - 02)
v. ප්‍රභාසංස්ලේෂණය සඳහා වැදගත්වන ,
   a. ශක්ති ප්‍රභවය  b. ශක්ති ප්‍රභේදය කුමක් ද ? (ලකුණු - 02)
vi. ජීවී විශේෂයක අඛණ්ඩ පැවැත්ම කෙරෙහි වැදගත්වන ජීව ලක්ෂණය කුමක් ද ? (ලකුණු - 01)

02. i) a. ජීවීන් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය.
1 b. ජීවීන් ශක්තිය නිදහස් කර ගැනීමේ ක්‍රියාවලිය.
1
ii)

| ශාක | සතුන් |
|---|---|
| 2 ස්වයංපෝෂී ය. සංචරණය නොකරයි. | සංචරණය කරයි. |
| හරිතලව ඇත | හරිතලව නැත. |

iii) ප්‍රභාසංස්ලේෂණයේදී $CO_2$ අවශෝෂණය කරන අතර $O_2$ පිටකරයි. එය
2 වායුගෝලයේ සමතුලිතතාවට වැදගත් වේ.
iv) ජලය, කාබන් ඩයොක්සයිඩ්.
2
v) a. සූර්යයා
2 b. ආලෝක ශක්තිය
vi) ප්‍රජනනය.
2
(12)

03. ශාක හා සතුන්ගේ පවතින විවිධත්වය පරිසර සුන්දරත්වයට හා පරිසර සමතුලතතාවයට වැදගත් වේ.

i. ජෛව විවිධත්වය යන පදය හඳුන්වන්න. (ලකුණු - 01)

ii. පහත ශාක ජීවත්වන පරිසර වෙන වෙනම ලියන්න.

a. සැල්විනියා  b. කඩොල්  c. වැටකෙයියා  d. කොස් (ලකුණු - 04)

iii.



a.



b.

iv. ඉහත පත්‍ර ආකාර 2 ක හඳුන්වන්න. (ලකුණු - 02)

v. ඉහත පත්‍ර ආකාර දකිය හැකි උදාහර්ණ ශාකයක් බැගින් ලියන්න. (ලකුණු - 02)

vi. ඉහළට වැඩීම සඳහා ආධාරකයක අවශ්‍යතාවය ඇති ශාක කාණ්ඩය හඳුන්වන නම හා උදාහර්ණ ශාකයක් ලියන්න. (ලකුණු - 01)

vi. පරිසරයේ දී හමුවන ශාක දෙකක් පහත දක්වේ.එම ශාක අතර ඇති වෙනස්කම් 2 ක් ඉදිරිපත් කරන්න.

a. මිරිස්  b. උක් (ලකුණු - 02)

03. i) ජීවීන් අතර පවතින විවිධත්වය. 1

ii) a. ජලජ  c. වෙරළබඩ 4

b. කලපුව  d. ගොවිබිම

iii) a. සරල පත්‍ර 2

b. සංයුක්ත පත්‍ර

iv) a - [illegible] 2

b - කරපිංචා

v) වැල් - පතෝලවැල් 1

vi) a. මුදුන් මුලක් ඇත 2

b. මුදුන් මුලක් නැත

12



04. සත්ත්ව විවිධත්වය පෙන්වන ආකාර දක්වෙන සටහනක් රූපයේ දක්වේ.




i. ඉහත සටහනේ a සහ b ස්ථාන වලට ඇතුලත් කළයුතු ආකාර ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

ii. භෝජන විලාසය අනුව සතුන් කාණ්ඩ දක්වා උදාහරණයක් බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු - 03)

iii. පහත දක්වෙන පරිසරවල ජීවත්වන සත්ත්වයෙක් බැගින් ලියන්න.

a. ජලජ - මාළුවා
b. පාංශු - ගැඩවිලා

iv. ගිරවා සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරන්න.

a. ජීවත්වන පරිසරය -
b. වර්ණය - කොළ පාට
c. ප්‍රමාණය -
d. සංචරණ ක්‍රමය - පියාසර කිරීම
e. භෝජන විලාසය - (ලකුණු - 05)

v. ජෛව ලෝකයේ අසිරිය සුරැකීමට ජෛව විවිධත්වය ආරක්ෂා කළ යුතුය. ඒ සඳහා අනුගමනය කළයුතු පියවර 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

2. වනාන්තර ආරක්ෂා කිරීම.

05. ක්ෂේත්‍ර චාරිකාවක දී හමු වූ ශාක කිහිපයක් පහත දක්වේ.

( පොල්, අඹ, මීවන, මෑ )

i. පහත ලක්ෂණ දරණ ශාකයක් බැගින් තෝරා ලියන්න.

a. මුදුන්මුලක් ඇත - අඹ
b. තන්තු මුල් ඇත - පොල්
c. මල් නොපිපේ. - මීවන
d. කඳ අතුවලට බෙදේ. - අඹ
e. වැල් ගණයට අයත් වේ. - මෑ
f. වෘක්ෂලෙස වැඩේ. - අඹ (ලකුණු - 06)

ii. ජීවී වර්ගීකරණය මගින් ලැබෙන ප්‍රයෝජන 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු - 02)

1. අධ්‍යයනය පහසු වීම.
2. නාමකරණය පහසු වීම.

iii. ඉහත සඳහන් ශාක දෙබෙදුම් සුචියක් මගින් වර්ග කරන්න. (ලකුණු - 05)






(විකා ගිලින, නොකා ගිලින, යුෂ උරා බොන, ඇවිදීම, පිහිනීම, පියාසර කිරීම, බාහිර ලක්ෂණ අනුව, භෝජන විලාෂය අනුව, ජලජ, වායුව,භෞමික)



පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | ජෛව ලෝකයේ ආශ්චර්යය | ඒකකය - 01 |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(01). වරහන් තුළ දී ඇති වචනවලින් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

i. හරිත ශාක ...................................... ජීවීන් වේ. (ස්වයංපෝෂී/විෂමපෝෂී)

ii. ජීවිත කාලය තුළම වර්ධනය වීම ...................................... සතු ලක්ෂණයකි. (ශාක/සතුන්)

iii. ...................................... සර්ව භක්ෂක සතෙකි. (සමනළයා/කපුටා)

iv. ...................................... තුළ පමණක් අඩංගු කොළ පැහැති වර්ණකය හරිතප්‍රද වේ. (ශාක/සතුන්)

v. ජීවීන් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය ...................... නම් වේ. (පෝෂණය/වර්ධනය)

vi. ශාක ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියේ දී ................................ වායුව පිට කරයි. (ඔක්සිජන්/නයිට්‍රජන්)

vii. පියවි ඇසට නොපෙනෙන ජීවීන් .......................... ලෙස හැඳින්වේ. (ක්ෂුද්‍ර ජීවීන්/මාංශ භක්ෂකයින්)

viii. වයසින් වැඩෙත්ම ජීවීන් ප්‍රමාණයෙන් විශාල වීම ............................... නම් වේ. (ප්‍රජනනය/වර්ධනය)

ix. ...................................... පියවි ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට යොදා ගනී. (අන්වීක්ෂය/දුරේක්ෂය)

x. ...................................... ශාක පත්‍ර අතින් ඇල්ලූ විට හැකිළේ. (නිදිකුම්බා/කතුරු මුරුංගා)

(ලකුණු 10)

(02). A කොටසේ දී ඇති අදහස පැහැදිලි කිරීමට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| i. | ශාක පමණක් ආහාරයට ගනී. | කාබන්ඩයොක්සයිඩ් |
| ii. | හරිතප්‍රද සහිත ශාකවල පමණක් සිදු වේ. | බැක්ටීරියා |
| iii. | අවර්ණ හුණු දියර කිරි පැහැයට හරවයි. | මහා රාවණා රැවුල |
| iv. | ජීවීන්ගේ අඛණ්ඩ පැවැත්මට අවශ්‍ය වේ. | ශාක භක්ෂකයන් |
| v. | සිරුර තුළ ශක්තිය නිපදවීමේ ක්‍රියාවලියයි. | සමනළයා |
| vi. | සංචරණය කළ නොහැකි චලන දක්වන සතෙකි. | දෙබෙදුම් සුවි |
| vii. | ජීවීන් වර්ග කිරීමට යොදා ගනී. | ප්‍රභාසංශ්ලේෂණය |
| viii. | යුෂ උරා බොන සත්වයෙකි. | මුහුදු මල |
| ix. | වෙරළබඩ ශාකයකි. | ශ්වසනය |
| x. | ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයකි. | ප්‍රජනනය |

(ලකුණු 10)

(03). පහත දැක්වෙන ජීවීන් අතුරින් ක්ෂුද්‍ර ජීවීන් රවුම් කරන්න.

| | | |
|---|---|---|
| අඹ ගස | මකුළුවා | පටිපනුවා |
| බැක්ටීරියා | දිලීර | පැරමීසියම් |
| ගවයා | කටුස්සා | සමනළයා |
| ඇමීබා | වෛරස් | අන්වීක්ෂීය පනුවන් |

(ලකුණු 05)

(04). පහත ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

i. ශාකවල ශ්වසන චලන නිරීක්ෂණය කළ නොහැක. (   )

ii. මාළුවා සංචරණය සඳහා කරමල් යොදා ගනී. (   )

iii. ගිරවා විකා ගිලින සත්ත්වයෙකි. (   )

iv. ශාකවල ආහාර නිපදවීමට අවශ්‍ය ශක්තිය සපයන්නේ සූර්යයා ය. (   )

v. සර්ව භක්ෂකයන් සෘජුවම හෝ වක්‍රව ශාක මත යැපේ. (   )

vi. කුඩළු ශාකය පැළෑටියකට උදාහරණයකි. (   )

vii. ප්‍රභාසංශ්ලේෂණය ශාකවලට පමණක් පොදු ලක්ෂණයකි. (   )

viii. පියාසර කිරීමට නොහැකි පක්ෂීන් ද ඇත. (   )

ix. සෑම සත්වයකුටම සංචරණය කළ හැක. (   )

x. ගොඩබිම ජීවත් වන සතුන් භෞමික සතුන් නම් වේ. (   ) (ලකුණු 10)

(05). දෙබෙදුම් සුචියක් මගින් පහත සතුන් වෙන් කර දක්වන්න.




(ලකුණු 15)

# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | ජෛව ලෝකයේ ආශ්චර්යය | ඒකකය - 01 |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**Answer**

(01). වරහන් තුළ දී ඇති වචනවලින් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

i. හරිත ශාක ........................................ ජීවීන් වේ. (ස්වයංපෝෂී/විෂමපෝෂී)

ii. ජීවිත කාලය තුළම වර්ධනය වීම ........................................ සතු ලක්ෂණයකි. (ශාක/සතුන්)

iii. ........................................ සර්ව භක්ෂක සතෙකි. (සමනළයා/කපුටා)

iv. ........................................ තුළ පමණක් අඩංගු කොළ පැහැති වර්ණකය හරිතප්‍රද වේ. (ශාක/සතුන්)

v. ජීවීන් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය ........................ නම් වේ. (පෝෂණය/වර්ධනය)

vi. ශාක ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියේ දී ................................ වායුව පිට කරයි. (ඔක්සිජන්/නයිට්‍රජන්)

vii. පියවි ඇසට නොපෙනෙන ජීවීන් ........................... ලෙස හැඳින්වේ. (ක්ෂුද්‍ර ජීවීන්/මාංශ භක්ෂකයින්)

viii. වයසින් වැඩෙත්ම ජීවීන් ප්‍රමාණයෙන් විශාල වීම ................................ නම් වේ. (ප්‍රජනනය/වර්ධනය)

ix. ........................................ පියවි ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට යොදා ගනී. (අන්වීක්ෂය/දුරේක්ෂය)

x. ........................................ ශාක පත්‍ර අතින් ඇල්ලූ විට හැකිළේ. (නිදිකුම්බා/කතුරු මුරුංගා)

(ලකුණු 10)

(02). A කොටසේ දී ඇති අදහස පැහැදිලි කිරීමට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| i. ශාක පමණක් ආහාරයට ගනී. | කාබන්ඩයොක්සයිඩ් |
| ii. හරිතප්‍රද සහිත ශාකවල පමණක් සිදු වේ. | බැක්ටීරියා |
| iii. අවර්ණ හුණු දියර කිරි පැහැයට හරවයි. | මහා රාවණා රැවුල |
| iv. ජීවීන්ගේ අඛණ්ඩ පැවැත්මට අවශ්‍ය වේ. | ශාක භක්ෂකයන් |
| v. සිරුර තුළ ශක්තිය නිපදවීමේ ක්‍රියාවලියයි. | සමනළයා |
| vi. සංචරණය කළ නොහැකි චලන දක්වන සතෙකි. | දෙබෙදුම් සුවි |
| vii. ජීවීන් වර්ග කිරීමට යොදා ගනී. | ප්‍රභාසංශ්ලේෂණය |
| viii. යුෂ උරා බොන සත්වයෙකි. | මුහුදු මල |
| ix. වෙරළබඩ ශාකයකි. | ශ්වසනය |
| x. ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයකි. | ප්‍රජනනය |

(ලකුණු 10)

(03). පහත දැක්වෙන ජීවීන් අතුරින් ක්ෂුද්‍ර ජීවීන් රවුම් කරන්න.

| | | |
|---|---|---|
| අඹ ගස | මකුළුවා | පටිපනුවා |
| බැක්ටීරියා | දිලීර | පැරමීසියම් |
| ගවයා | කටුස්සා | සමනළයා |
| ඇමීබා | වෛරස් | අන්වීක්ෂීය පනුවන් |

(ලකුණු 05)

# Answer

(04). පහත ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

i. ශාකවල ශ්වසන චලන නිරීක්ෂණය කළ නොහැක. ( ✓ )

ii. මාළුවා සංචරණය සඳහා කරමල් යොදා ගනී. ( ✗ )

iii. ගිරවා විකා ගිලින සත්ත්වයෙකි. ( ✗ )

iv. ශාකවල ආහාර නිපදවීමට අවශ්‍ය ශක්තිය සපයන්නේ සූර්යයා ය. ( ✓ )

v. සර්ව භක්ෂකයන් ඍජුවම හෝ වක්‍රව ශාක මත යැපේ. ( ✓ )

vi. කුඩළු ශාකය පැළැටියකට උදාහරණයකි. ( ✓ )

vii. ප්‍රභාසංශ්ලේෂණය ශාකවලට පමණක් පොදු ලක්ෂණයකි. ( ✗ )

viii. පියාසර කිරීමට නොහැකි පක්ෂීන් ද ඇත. ( ✓ )

ix. සෑම සත්වයකුටම සංචරණය කළ හැක. ( ✗ )

x. ගොඩබිම ජීවත් වන සතුන් භෞමික සතුන් නම් වේ. ( ✓ ) (ලකුණු 10)

(05). දෙබෙදුම් සුචියක් මගින් පහත සතුන් වෙන් කර දක්වන්න.




(ලකුණු 15)

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය : 1 - ජෛව ගෝලයේ අසිරිය |
|---|---|---|

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) සියලුම ජීවීන්ට පොදු ජීව ක්‍රියාවකි.
1) ශ්වසනය 2) වර්ධනය 3) ප්‍රජනනය 4) ඉහත සියල්ලම

(2) සංචරණය කල නොමැකි සත්වයෙකි,
1) මුහුදු වල 2) පැස්බරා 3) පෙන්ගුයින් 4) ජෙලි ෆිෂ්

(3) ශාක චලන වලට උදාහරණයක් නොවන්නේ,
1) නිදිකුම්බා ශාක පත්‍ර අතින් ඇල්ලු විට හැකිලීම.
2) සවස් කාලයේ දී කතුරුමුරුංගා පත්‍ර හැකිලීම.
3) සවස් කාලයේ දී සියඹලා පත්‍ර හැකිලීම.
4) සවස් කාලයේ දී පේර පත්‍ර හැකිලීම.

(4) ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට යොදා ගත හැකි උපකරණයකි.
1) සංයුක්ත අන්වීක්ෂයකි 2) දුරේක්ෂය වේ
3) සරල අන්වීක්ෂය වේ 4) බහුරූපේක්ෂය වේ

(5) ශ්වසන චලන නිරීක්ෂණය කළ හැකි ජීවියෙකි.
1) අක්කපාන 2) බෝ 3) නිදිකුම්බා 4) මීයා

(6) අවර්ණ හුණුදියර මගින් හඳුනා ගන්නේ
1)ඔක්සිජන් 2) කාබන්ඩයොක්සයිඩ් 3) හයිඩ්‍රජන් 4)නයිට්‍රජන්

(7)වරහන් තුල දී ඇති වචන වලින් ගැලපෙන පිළිතුර තෝරා ලියන්න
අප සිරුර තුලට. ....................... ඇතුල්කිරීම ....................... ලෙසත්. ....................... පිටකිරීම ................... ලෙසත් හැඳින්වේ. සතුන් තැනින් තැනට යෑම ..................... ලෙස හැඳින්වේ . ජීවීන් ප්‍රමාණයෙන් විශාලවීම .................... ලෙස හැඳින්වේ. ....................... ශාක නිපදවන ආහාර මත සතුන් ඍජුවම හෝ වක්‍රව යැපීම සිදුවේ. එම සතුන් ..................... ලෙස හැඳින්වේ. සූර්ය ශක්තිය උපයෝගී කරගෙන ආහාර නිපදවීමේ ක්‍රියාවලිය ........................... ලෙස හැඳින්වේ. නව ජීවීන් බිහිකිරීමේ ක්‍රියාවලිය ....................... නම්වේ. ජීවීන් සිය ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය ......................... නම්වේ. .(ප්‍රභාසංස්ලේෂණය, පෝෂණය, ආශ්වාසය, සංචරනය, වර්ධනය, ප්‍රශ්වාසය, ඔක්සිජන්, විෂමපෝෂීන්, ප්‍රාජනනය, කාබන්ඩයොක්සයිඩ් )

(8) 1) ශාක හා සතුන් අතර වෙනස්කම් සංසන්දනය කරන්න.
2) ජීවීන් බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ 3 නම් කරන්න.
3) ජීවීන්ගේ ලක්ෂණ 2 ක් ලියන්න.

4) පහත සඳහන් සතුන් හඳුනාගන්න.







A. .................................. B. .................................. C. ..................................

(9) 1) ප්‍රභාසංස්ලේෂණය, ශ්වසනය, වර්ධනය යන පද හඳුන්වන්න.
2) ශාකයක වර්ධනය මනින උපකරණයේ නම කුමක් ද?
3) පිදුරු පල් කල ජලයේ හමුවන ක්ෂුද්‍ර ජීවීන්ගේ නම ලියන්න.
4) ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න.
5) ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සිදුවන හානි 2 ක් ලියන්න.

(10) 1) දෙබෙදුම් සුවියක් යන්න අර්ථ දක්වන්න.
2) දෙබෙදුම් සුවියක් මගින් පහත ශාක වර්ග කරන්න.
(බෝ, අක්කපාන, කතුරුමුරුංගා, නුග)
3) දෙබෙදුම් සුවියක් මගින් පහත සතුන් වර්ග කරන්න.
(ගිරවා, නයා, කැරපොත්තා, පිළිහුඩුවා)

(11) පහත දෙබෙදුම් සුවියේ හිස්තැන් පුරවන්න.

බෝ, කතුරුමුරුංගා, බෝගන්විලා, නිවිති

- ශාක කඳෙහි කටු ඇති
  (බෝගන්විලා)
- ශාක කඳෙහි කටු නැති
  (බෝ, කතුරුමුරුංගා, නිවිති)
  - ..........................................
    (බෝ)
  - ..........................................
    (කතුරුමුරුංගා, නිවිති)
    - පත්‍රය පත්‍රිකා ලෙස බෙදී ඇත.
      (කතුරුමුරුංගා)
    - පත්‍රය පත්‍රිකා ලෙස බෙදී නැත.
      ..................................................

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය : 1 - ජෛව ගෝලයේ අසිරිය |
|---|---|---|

**Answer**

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) සියලුම ජීවීන්ට පොදු ජීව ක්‍රියාවකි.
1) ශ්වසනය   2) වර්ධනය   3) ප්‍රජනනය   4) ඉහත සියල්ලම

(2) සංචරණය කල නොමැකි සත්වයෙකි,
1) මුහුදු වල   2) පැස්බරා   3) පෙන්ගුයින්   4) පෙළි පිෂ්

(3) ශාක චලන වලට උදාහරණයක් නොවන්නේ,
1) නිදිකුම්බා ශාක පත්‍ර අතින් ඇල්ලු විට හැකිලීම.
2) සවස් කාලයේ දී කතුරුමුරුංගා පත්‍ර හැකිලීම.
3) සවස් කාලයේ දී සියඹලා පත්‍ර හැකිලීම.
4) සවස් කාලයේ දී පේර පත්‍ර හැකිලීම.

(4) ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට යොදා ගත හැකි උපකරණයකි.
1) සංයුක්ත අන්වීක්ෂයකි   2) දුරේක්ෂය වේ
3) සරල අන්වීක්ෂය වේ   4) බහුරූපේක්ෂය වේ

(5) ශ්වසන චලන නිරීක්ෂණය කළ හැකි ජීවියෙකි.
1) අක්කපාන   2) බෝ   3) නිදිකුම්බා   4) මීයා

(6) අවර්ණ හුණුදියර මගින් හඳුනා ගන්නේ
1)ඔක්සිජන්   2) කාබන්ඩයොක්සයිඩ්   3) හයිඩ්‍රජන්   4)නයිට්‍රජන්

(ලකුණු 12)

**Answer**

1. ඔක්සිජන්
2. ආශ්වාසය
3. කාබන්ඩයොක්සයිඩ්
4. ප්‍රශ්වාසය
5. සංචරනය
6. වර්ධනය
7. විෂමපෝෂීන්
8. ප්‍රභාසංස්ලේෂණය
9. ප්‍රජනනය
10. පෝෂණය

(ලකුණු 10)

# Answer

1. <u>ශාක</u> - ජීවිත කාලය පුරා ම වර්ධනය වේ. ශාකවල හරිතප්‍රද නම් කොළ පැහැති වර්ණකය ඇත. ශාක ස්වයංපෝෂීන් වේ. ශාක සංචරණය නොකරන අතර චලන දක්වයි.

   <u>සතුන්</u> - වර්ධනයේ සීමාවක් ඇත. හරිතප්‍රද වර්ණකය නැත. විෂමපෝෂීන් වේ. බොහෝ සත්තු තැනින් තැනට ගමන් කරති. එනම් සංචරණය කරති. (ලකුණු 06)

2. ශාක, සතුන් හා ක්‍ෂුද්‍ර ජීවීන් (ලකුණු 03)

3. වර්ධනය, පෝෂණය, චලනය, ශ්වසනය, ප්‍රජනනය (ලකුණු 02)

4. ඇමීබා, පැරමීසියම්, ක්ලැමිඩොමොනාස්. (ලකුණු 03)

# Answer

1. හරිත ශාක (කොළ පැහැති හරිතප්‍රද නම් වර්ණකය ඇති ශාක) වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් වායුව හා පසෙන් උරා ගත් ජලය යොදා ගෙන සූර්ය ශක්තිය උපයෝගී කර ගෙන ආහාර නිෂ්පාදනය කරයි. මෙම ක්‍රියාවලිය <u>ප්‍රභාසංශ්ලේෂණය</u> ලෙස හඳුන්වයි. (ලකුණු 02)
   සිරුර තුළ ශක්තිය නිපදවා ගැනීමේ ක්‍රියාවලිය <u>ශ්වසනය</u> ලෙස හැඳින්වේ. (ලකුණු 02)
   ජීවීන් ප්‍රමාණයෙන් විශාල වීම <u>වර්ධනය</u> ලෙස හඳුන්වයි. (ලකුණු 02)

2. වෘද්ධිමානය (ලකුණු 03)

3. පැරමීසියම් (ලකුණු 02)
4. යෝගට් සෑදීම, විනාකිරි සෑදීම. (ලකුණු 02)
5. ලෙඩ රෝග සෑදීම, ආහාර නරක් කිරීම. (ලකුණු 02)

# Answer

1. යම් ලක්ෂණයක් පදනම් කරගෙන එම ලක්ෂණය පැවතීම හෝ නොපැවතීම (ඇති හෝ නැති බව) අනුව ජීවීන් වර්ග කිරීම දෙබෙදුම් සුචි ක්‍රමය ලෙස හඳුන්වයි. (ලකුණු 03)

2. බෝ, අක්කපාන, කතුරුමුරුංගා, නුග

- පත්‍රය පත්‍රිකා ලෙස බෙදී ඇත
  කතුරුමුරුංගා
- පත්‍රය පත්‍රිකා ලෙස බෙදී නැත
  බෝ, අක්කපාන, නුග
  - පත්‍ර අග්‍රයේ තුඩක් ඇත
    බෝ, නුග
    - කයුරු මුල් ඇත
      නුග
    - කයුරු මුල් නැත
      බෝ
  - පත්‍ර අග්‍රයේ තුඩක් නැත
    අක්කපාන

(ලකුණු 20)

3. ගිරවා, නයා, කැරපොත්තා, පිළිහුඩුවා

- පියාපත් ඇත.
  ගිරවා, කැරපොත්තා, පිළිහුඩුවා
  - පාද හයක් ඇත
    කැරපොත්තා
  - පාද හයක් නැත
    ගිරවා, පිළිහුඩුවා
    - වක්‍ර හොටක් ඇත.
      ගිරවා
    - වක්‍ර හොටක් නැත.
      පිළිහුඩුවා
- පියාපත් නැත.
  නයා

(ලකුණු 20)

1. පත්‍ර අග්‍රයේ තුඩක් ඇත
2. පත්‍ර අග්‍රයේ තුඩක් නැත
3. නිවිති

(ලකුණු 06)



හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

**6 ශ්‍රේණිය**

**ඒකකය 1 - ජෛව ගෝලයේ අසිරිය**

1) එදින නිවාඩු දිනයක් බැවින් සුපුන් තම ගෙවත්තේ ඇවිදිමින් උදෑසන සිරි නරඹන විට ඔහුගේ සිත් යොමුවූ සිදුවීම් කිපයක් පහත දැක්වේ.

- ❖ සූරියකාන්ත ගසේ මල් හිරු දෙසට හැරී පිපී තිබීම.
- ❖ සමනල්ලු මලින් මලට පියඹමින් මල්පැණි උරාබීම.
- ❖ ඇටිකුකුලෙකු පියඹා විත් සමනලයෙකු අල්ලා ගැනීම.
- ❖ පේරගසේ ඉදුනු පේර ගෙඩියක රස බලන ලේනෙකු සිටීම.

i. මෙහි ඇති ජීවී දෑ නම් කරන්න.

ii. ඔබ ඉහත සඳහන් කල දෑ ජීවී යැයි හැඳින්වීමට හේතුවූ මෙහි සඳහන් වන කරුණු 2ක් ලියන්න.

iii. සංචරණය යනු කුමක්ද?
මෙහි සිටින සංචරණය කරන සහ නොකරන ජීවීන් වෙන්කර දක්වන්න.

| සංචරණය කරන | සංචරණය නොකරන |
|---|---|
| | |

සංචරණ ක්‍රම 2ක් ලියන්න.

iv. භෝජන ගන්නා ක්‍රමය අනුව මෙහි සිටින සතුන් වෙන්කර දක්වන්න.

| භෝජන ගන්නා ක්‍රමය | සතුන් |
|---|---|
| | |

v. මෙම ජීවීන් දෙබෙදුම් සූචියක් මගින් වර්ග කර දක්වන්න.

2) පහත දක්වා ඇත්තේ 6 ශ්‍රේණියේ සිසුවෙකු නිරීක්ෂණය කරන ලද ජීවීන් කිහිප දෙනෙකි.



A ................................



B ................................



C ................................

i. මෙහි A,B,C ජීවීන් නම් කරන්න.

ii. මෙම ජීවීන් අයත් වන ජීවී කාණ්ඩය කුමක්ද?

iii. මෙම ජීවීන් නිරීක්ෂණයට යොදාගත හැකි උපකරණය කුමක්ද?

iv. ඉහත සඳහන් කල ජීවී කාණ්ඩයෙන් මිනිසාට ඇති ප්‍රයෝජන 2ක් ලියන්න.

(B) විද්‍යාගාරයේ සකස් කර තිබූ ඇටවුමක් පහත දැක්වේ.




i. මෙම ඇටවුම හඳුන්වන්නේ කෙසේද?

ii. මෙම ඇටවුම මගින් පෙන්වීමට අදහස් කරන්නේ කුමක් විය හැකිද?

iii. මෙහිදී යොදාගන්නා ශාකය සඳහා වඩාත් සුදුසු වන්නේ මුං පැළයක්ද කොස් පැළයක්ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

iv. මෙම ඇටවුම සකස් කර සතියකට පමණ පසු බැලූ විට දැකිය හැකි නිරීක්ෂණය කුමක්ද?

v. මෙහි යොදා ඇති භාරයේ බර 5 ගුණයකින් පමණ වැඩි කලහොත් කුමක් සිදුවිය හැකිද?

3)

A) 6 ශ්‍රේණියේ සිසුන් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කල ගුරුතුමිය සිසුන් කණ්ඩායම් වලට බෙදා අවශ්‍ය උපකරණ කට්ටලයක්ද සපයනු ලැබෙයි.

i. ක්ෂේත්‍ර චාරිකාවට ගෙනයාම සඳහා ගුරුතුමිය ලබාදුන් උපකරණ කට්ටලයේ තිබිය හැකි උපකරණ /ද්‍රව්‍ය 2ක් නම් කරන්න.

ii. ක්ෂේත්‍ර චාරිකාවක යෙදීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 2ක් ලියන්න.

iii. ක්ෂේත්‍ර චාරිකාවක යෙදීමෙන් සැලසෙන වාසි 2ක් ලියන්න.

iv. ක්ෂේත්‍ර චාරිකාවේදී සිසුන් කණ්ඩායමක් ගසක් යටින් පස් සාම්පලයක් ලබාගන්නා ලදී.




B) එහි සිටිය හැකි පාංශු ජීවියකු නම් කරන්න. එම පස් සාම්පලයේ ක්ෂුද්‍ර ජීවීන් සිටීදැයි බැලීම සඳහා සකස් කළ ඇටවුමක් පහත දැක්වේ.

i. ක්ෂුද්‍ර ජීවීන් යනු කවුරුන්දැයි හඳුන්වන්න.

ii. මෙහිදී පස් සාම්පලයට ඉහළින් බල්බයක් දල්වා තැබීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?

iii. පසේ හැර ක්ෂුද්‍ර ජීවීන් සිටිය හැකි වෙනත් ස්ථාන 2ක් නම් කරන්න.

iv. මෙහි බීකරයේ එකතු වන ජලයේ ක්ෂුද්‍රජීවීන් නිරීක්ෂණයට අවශ්‍ය උපකරණ මොනවාද?

v. ක්ෂුද්‍ර ජීවීන් අපට අහිතකර වන අවස්ථා 2ක් ලියන්න.

4) ජලජ පරිසරයක හමුවන ජීවීන් කිහිප දෙනෙකු පහත දැක්වේ.


A


B


C

i. A සත්ත්වයා හඳුනාගෙන නම් කරන්න.

ii. එම සත්ත්වයා අනෙක් බොහෝ සතුන්ගෙන් වෙනස් වන ලක්ෂණයක් ලියන්න.

iii. B ලෙස දක්වා ඇත්තේ ජලජ ශාකයක් වන නෙළුම් ශාකයකි. මේ හැර වෙනත් ජලජ ශාක 2ක් නම් කරන්න.

iv. (a) ජලජ පරිසර හැර ශාක වැඩෙන වෙනත් පරිසර 3ක් නම් කරන්න.
(b)ඉහත නම් කළ පරිසරවල වැඩෙන ශාක 2 බැගින් ලියන්න.

v. මාලුවාද ජලජ සත්ත්වයෙකි. පහත අවශ්‍යතා සඳහා මාලුවාට වැදගත්වන උපාංග නම් කරන්න.

(a)සංචරණය

(b)ශ්වසනය

vi. ශාක මෙන්ම සතුන්ද ශ්වසනයේදී වායු ගෝලයෙන් ලබාගන්නා වායුව කුමක්ද?

vii. ඉහත ජීවින් අතරින් ස්වයංපෝෂි ජීවියා නම් කරන්න.

viii. මෙම ජීවින් ප්‍රධාන කාණ්ඩ යටතේ වර්ග කරන්න.

ix. ඔබ ඉහත සඳහන් ජීවි කාණ්ඩ දෙක අතර දැකිය හැකි වෙනස්කම් 2ක් ලියන්න.

5) පියුමි සහ සයුනි යන යෙහෙළියන් දෙදෙනා පාසල් යන අතරතුර පාර අයිනේ බලු පැටවෙකු වැතිර සිටුනු දැකීය. බලු පැටවා අසලට ගියද ඌ කිසිඳු ප්‍රතිචාරයක් නොදක්වා වැතිර සිටිය අතර සඳුනි ඌ මැරී ඇති බව පැවසීය. නමුත් බලු පැටියා දෙස ටිකවෙලාවක් විමසිල්ලෙන් බලාසිටි පියුමි ඌ මැරී නැති බවත් හුස්ම ගන්නා බවත් පැවසීය.

i. බලු පැටියා හුස්ම ගන්නා බවට පියුමිට ලැබුණු නිරීක්ෂණය කුමක් විය හැකිද?

ii. බලු පැටියා ශ්වසනයේදී වායුගෝලයෙන් ලබාගන්නා වායුව හා වායුගෝලයට පිටකරන වායුව පිළිවෙලින් නම් කරන්න.

a - ලබාගන්නා වායුව - b - පිටකරන වායුව -

iii. ශ්වසනය යනු කුමක්ද?

iv. පියුමි විද්‍යාගාරයේදී කල ක්‍රියාකාරකමක් පහත දැක්වේ.

මෙහිදී බීම බටයේ විවෘත කෙළවරට කට තබා B ද්‍රාවණයට ප්‍රාශ්වාස වාතය බුබුලනය කරන ලදී.




a) මෙම ඇටවුම කවර ක්‍රියාවලියක් ආදර්ශනය සඳහා සැලසුම් කරන ලද්දක් වේද?

b) මෙහි B ලෙස යොදාගෙන ඇති ද්‍රාවණය කුමක්ද?

c) මෙහිදී දැකිය හැකි නිරීක්ෂණය ලියන්න.

d) එම නිරීක්ෂණය මගින් එළඹිය හැකි නිගමනය කුමක්ද?

6) හරිතශාක නිපදවන ආහාර මත සතුන් සෘජුවම හෝ වක්‍රව යැපේ.




i. හරිත ශාක තුල ආහාර නිපදවීමේ ක්‍රියාවලිය කෙසේ හැඳින්වේද?

ii. ඉහත ක්‍රියාවලිය සඳහා අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා පහත ද්‍රව්‍ය නම් කරන්න.

*x* –

*y*-

iii. Z ලෙස වායුගෝලයට පිටවන වායුව කුමක්ද?

iv. ඉහත ක්‍රියාවලිය සඳහා ශක්තිය ලබාදෙන ශක්ති ප්‍රභවය කුමක්ද?

v. (a)හරිතශාක මත සෘජුවම යැපෙන සතුන් දෙදෙනෙක් නම් කරන්න.

(b)හරිතශාක මත වක්‍රව යැපෙන සතුන් දෙදෙනෙක් නම් කරන්න.

vi. සියලුම හරිත ශාක ස්වයංපෝෂින් වේ. එසේ නම් සියළුම සතුන් හැඳින්විය හැක්කේ කෙසේද?

vii. කපුටා ,ගවයා, මුවා, කොටියා, කුකුළා, නයා යන සතුන් භෝජන විලාසය අනුව වෙන්කර දක්වන්න.

7) අප අවට පරිසරයේ ඇති දෑ ජීවි අජීවි ලෙස වෙන්කළ හැකිය.

i. ජීවින් බෙදිය හැකි ප්‍රධාන කාණ්ඩ 3 නම් කරන්න.

ii. ජීවින්ට පොදු වූ ලක්ෂණ 2ක් ලියන්න.

iii. ඔබේ පන්ති කාමරයේ ඇති අජීවි දේ 3ක් ලියන්න.

iv. ඔබ ඉහත සඳහන් කළ දේ අජීවී යැයි හැඳින්වීමට කරුණු 2ක් ඉදිරිපත් කරන්න.

v. පරිසරයේ හමුවන

a) ස්වයංපෝෂී ජීවීන් දෙදෙනෙක් නම් කරන්න.

b) විෂම පෝෂී ජීවීන් දෙදෙනෙක් නම් කරන්න.

vi. (a) ප්‍රජනනය යනු කුමක්ද?

(b) ජීවීන්ට ප්‍රජනන ක්‍රියාවලියේ ඇති වැදගත්කම කුමක්ද?

(c) ශාක ප්‍රජනනය සඳහා යොදාගන්නා ක්‍රම 2ක් ලියන්න.

8) පහත දක්වා ඇත්තේ දෙබෙදුම් සූචියක් මගින් වර්ගීකරණයට ලක්කල ශාක කීහිපයකි.

i. ඉහත දෙබෙදුම් සූචියේ හිස්තැනට සුදුසු වචන යොදන්න.




ii. දෙබෙදුම් සූචියක් ගොඩනගා ඇත්තේ කවර කරුණක් පදනම් කරගෙනදැයි පැහැදිලි කරන්න.

9) පහත දී ඇති ජීවීන්ද යොදාගනිමින් ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු සපයන්න.

බිම්තඹුරු, කොරල්බුහුබාව, කිරල, ගැඩවිලා, මයිනා, කොස්, ගවයා, උකුස්සා

i. මෙහි සිටින හරිතප්‍රද සහිත ජීවීන් නම් කරන්න.

ii. ශාක භක්ෂක සතෙක් නම් කරන්න.

iii. වෙරළබඩ ශාකයක් ලියන්න.

iv. කඩොලාන ශාකයක් නම් කරන්න.

v. මෙහි සිටින පාංශු සත්ත්වයා කවුද?

vi. කොස් ගස හ ... ල් බුහුබාවා අතර ඇති

a) සමානක c)

b) අසමානකමක් බැගින් ලියන්න

vii. ඉහත ජීවින් වර්ගීකරණය කිරීම සඳහා සුදුසු වර්ගීකරණ ක්‍රමයක් නම් කරන්න.

10)පැළ කරන ලද මුං බීජ කිපයක් සතියක් පමණ ජනේලය අසල තබා තිබුණි.




i. ඉහත ක්‍රියාකාරකම මගින් පෙන්වා දිය හැක්කේ ජීවි බවේ කවර ලක්‍ෂණාද?

ii. හරිත ශාක හිරු එළිය දෙසට වැඩී නැමීමට හේතුව විය හැක්කේ කුමක්ද?

iii. කෙටි කාලාන්තරයක් තුළ නිරීක්‍ෂණය කළ හැකි ශාක දක්වන චලන 2ක් ලියන්න.

iv. සංචරණය කළ නොහැකි නමුත් විවිධ චලන පමණක් පෙන්වන සතුන් ද පරිසරයේ හමුවේ. එවැනි සතුන් දෙදෙනෙක් නම් කරන්න.

v. වර්ධනය යනු කුමක්ද?

vi. ශාකයක වර්ධනය මැනීම සඳහා භාවිතා කරන උපකරණය නම් කරන්න.

vii. ශාක හා සතුන් අතර දැකිය හැකි වර්ධනයේ වෙනස කුමක්ද?

**6 ශ්‍රේණිය**

**<u>ඒකකය 01 - ජෛව ලෝකයේ අසිරිය</u>**

**පිළිතුරු පත්‍රය**

1)

i. සූරියකාන්ත ගස, සමනල්ලු, ඇටිකුකුළා, පේරගස, ලේනා (ල.02)

ii. චලන දැක්වීම පෝෂණය (ල.02)

iii. (a) සත්ත්වයෙකු එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කිරීම. (ල.01)

(b)

| සංචරණය කරන | සංචරණය නොකරන |
|---|---|
| සමනලයා<br>ඇටි කුකුළා<br>ලේනා | සූරියකාන්ත ගස<br>පේර ගස |

(ල.02)

(c) ඇවිදීම / පියෑඹීම / පිහිනීම / බඩගායාම (ල.02)

iv.

| භෝජන ගන්නා ක්‍රමය | සතුන් |
|---|---|
| යුෂ උරා බොන<br>නොවිකා ගිලින<br>විකා ගිලින | සමනලයා<br>ඇටිකුකුළා<br>ලේනා |

(ල.03)

v. සුදුසු ලක්ෂණ ගෙන සකස්කර ඇති ඕනෑම දෙබෙදුම් සුචියක් සඳහා (ල.04)

(මුළු ලකුණු.16)

2) A

i. A – ඇමීබා B- පැරමීසියම් C- බැක්ටීරියා (ල.03)

ii. ක්ෂුද්‍ර ජීවීන් (ල.01)

iii. ආලෝක අන්වීක්ෂය / සංයුක්ත අන්වීක්ෂය (ල.01)

iv. කොම්පෝස්ට් සෑදීම / විනාකිරි නිපදවීම / මුදවපු කිරි යෝගට් නිපදවීම / ජීව වායුව නිපදවීම ආදි නිවැරදි පිළිතුරකට (ල.02)

B

i. වෘද්ධි මානය (ල.01)

ii. ශාකයේ වර්ධනය (ල.01)

iii. මුං පැළයක් (ල.01)

හේතුව : කෙටිකාලයකින් සීඝ්‍ර වර්ධනයක් දක්වන්නේ මුං පැළය නිසා එය මේ සඳහා වඩාත් සුදුසුය. කොස් පැළය වර්ධනය වන්නේ ඉතා සෙමිනි. (ල.02)

iv. ඉඳිකටුව පරිමාණයේ ඉහළට ගමන් කර තිබීම.

- භාරය පහළට ගමන්කර තිබීම. (ල.02)

v. පැළයේ දල්ල කැඩී යා හැක වැනි සුදුසු පිළිතුරකට (ල.02)

(මුළු ලකුණු.16)

3) A

i. අත්කාචය, කුඩා කුප්පි, යෝගට් කෝප්ප, මුල්ලුව ,උෂ්ණත්වමානය ආදි පිළිතුරකට (ල.02)

ii. අනතුරුදායක ස්ථාන ශාක හා සතුන්ගෙන් ආරක්ෂා වීම.

- පරිසරයේ ශාක හා සතුන්ට හානි නොකිරීම. (ල.02)

iii. සතුටක් / වින්දනයක් ලැබීම

- නිරීක්ෂණ හැකියාව වැඩිදියුණු වීම.
- කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට හුරුවීම.
- නායකත්වයට ගරු කිරීම. (ල.02)

iv. ගැඩවිලා ,කම්බිපනුවා වැනි සුදුසු ජීවියෙකුට (ල.01)

(B)

i. තනි තනිව ගත්කල පියවි ඇසට නොපෙනෙන ජීවින් ක්ෂුද්‍ර ජීවින් ලෙස හැඳින්වේ. (ල.01)

ii. ක්ෂුද්‍ර ජීවින් ආලෝකයෙන් ඉවතට ගමන් කර පුනීලයේ පතුලට ගමන් කිරීමට සැලැස්වීම. (ල.01)

iii. වාතය ජලය ශරීර මතුපිට ශරීර අභ්‍යන්තරය (ල.01)

iv. සංයුක්ත අන්වීක්ෂය, වීදුරු කදාව, වැසුම් පෙත්ත (ල.01)

v. ආහාර නරක් කිරීම
ලෙඩ රෝග සෑදීම (ල.02)

(මුළු ලකුණු 13)

4)

i. මුහුදු මල (ල.01)

ii. සංචරණය කල නොහැකිවීම (ල.01)

iii. සැල්වීනියා ,ඕලු, මානෙල්,හයිඩ්‍රිල්ලා, ජපන්ජබර ආදී (ල.01)

iv. කඩොලාන ,ශුෂ්ක,වෙරළබඩ, භෞමික/මධ්‍ය (ල.02)
කඩොලාන - කිරල මණ්ඩ කඩොල් ආදී
ශුෂ්ක - පතොක් දළුක් සියඹලා කෝමාරිකා ආදී
වෙරළබඩ - වැටකෙයියා ,බිම්තඹුරු ,ලෝනියා ආදී (ල.03)
මධ්‍ය / භෞමික - කොස් ,පොල්, දෙල් ආදී

v. (a) වරල් (ල.01)
(b) ජලක්ලෝම / කරමල් (ල.01)

vi. ඔක්සිජන් (ල.01)

vii. නෙළුම් ශාකය (ල.01)

viii.

| ශාක | සතුන් |
|---|---|
| නෙළුම් ශාකය | මුහුදුමල<br>මාළුවා |

(ල.02)

ix.

| ශාක | සතුන් |
|---|---|
| • සංචරණය කරයි.<br>• හරිතප්‍රද ඇත.<br>• ස්වයං පෝෂිවීම<br>• ජීවිත කාලය පුරාම වර්ධනය වේ. | • සංචරණය නොකරයි.<br>• හරිතප්‍රද නැත.<br>• විෂම පෝෂි වේ.<br>• වර්ධනය සීමා සහිතය. |

(ල.02)

(මුළු ලකුණු.16)

5)

i. උරස් කුහරය උස්පහත් වීම යන අදහසට (ල.02)

ii. a - ඔක්සිජන් (ල.01)
b - කාබන්ඩයොක්සයිඩ් (ල.01)

iii. සංචිත ආහාර මත ඔක්සිජන් ක්‍රියාකර ශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය යන අදහසට

iv. (a) ප්‍රාශ්වාස වාතයේදී පිටවන වායුව හඳුනා ගැනීම. (ල.01)
(b) හුණු දියර (ල.01)
(c) හුණු දියර කිරිපාට වීට (ල.02)
(d) ප්‍රාශ්වාස වාතයේ $CO_2$ ඇතිබව (ල.01)
(මුළු ලකුණු 11)

6)
i. ප්‍රභාසංස්ලේෂණය (ල.01)
ii. $x$ ජලය Y – $CO_2$ (ල.02)
iii. ඔක්සිජන් (ල.01)
iv. සූර්යයා (ල.01)
v. ගවයා ,මුවා ,එළුවා ආදී (ල.01)
vi. විෂමපෝෂී (ල.01)
vii. ශාක භක්ෂක : ගවයා ,මුවා
මාංශ භක්ෂක : කොටියා ,නයා
සර්ව භක්ෂක : කපුටු ,කුකුළා (ල.03)

7)
i.
- ශාක
- සතුන්
- ක්ෂුද්‍රජීවීන් (ල.03)

ii. වර්ධනය / ප්‍රජනනය / පෝෂණය/ ශ්වසනය / චලන දැක්වීම (ල.02)
iii. නෙත පෑන පැන්සල් පෙට්ටිය ආදී (ල.01)
iv. වර්ධනය නොවේ / ශ්වසනය නොකරයි / චලන නොදක්වයි ආදී (ල.02)
v. a) ඕනෑම හරිත ශාකයක් (ල.01)
b) ඕනෑම සත්ත්වයෙක් (ල.01)
vi. a) තම වර්ගයා බෝකිරීමේ ක්‍රියාවලිය ප්‍රජනනයයි. (ල.01)
b) තම පරම්පරාව අඛණ්ඩව පවත්වා ගැනීම. (ල.01)
c) අතු කැබලි මුල් බීජ ආදිය මගින් (ල.01)
(මුළු ලකුණු 13)

8)
i. a) අතු බෙදී නැත
b) සියඹලා නුග මිරිස්
c) සංයුක්ත පත්‍ර නැත
d) සියඹලා
e) උණ
f) පොල්
g) කරුමුල් ඇති
h) මිරිස්
(1 x 8) (ල.08)

ii. යම් ලක්ෂණයක ඇති / නැති බව පදනම් කර ගනිමින් (ල.03)
(මුළු ලකුණු 11)

9)
i. බිම්තඹුරු කිරල කොස් (ල.02)
ii. ගවයා (ල.01)
iii. බිම්තඹුරු (ල.01)
iv. කිරල (ල.01)
v. ගැඩවිලා (ල.01)
vi. a) සංචරණය නොකිරීම (ල.02)

| කොස් | කොරල් / බුහුබාවා |
|---|---|
| • ප්‍රභාසංස්ලේෂි වේ<br>• හරිතප්‍රද ඇත | විෂමපෝෂීවේ<br>හරිතප්‍රද නැත ආදී |

b)

(ල.02)

vii. දෙබෙදුම් සුචි (ල.01)

(මුළු ලකුණු 11)

10)

i. වර්ධනය, චලන දැක්වීම (ල.02)

ii. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය සූර්යාලෝකය ලබා ගැනීමට (ල.02)

iii. ස්පර්ශ කළ විට නිදිකුම්බා ශාක පත්‍ර හැකිලීම.
අඳුරු වැටෙන විට මාර කතුරුමුරුංගා පත්‍ර හැකිලීම (ල.02)

iv. මුහුදු මල කොරල් බුහුබාවා (ල.02)

v. ජීවින් ප්‍රමාණයෙන් විශාල වීම වර්ධනයයි (ල.02)

vi. වෘද්ධිමානය (ල.01)

vii. ශාක ජීවිත කාලය පුරාම වර්ධනය වේ. සතුන්ගේ වර්ධනය සීමා සහිතය. (ල.02)

(මුළු ලකුණු 13)



හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1